(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 6(2).]

# පාර්ලිමේන්තුවේ අංක 6 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2012 ජූනි මස 22 වැනි සිකුරාදා**

## 2012 ජූලි මස 04 වැනි බදාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2011 අංක 17 දරන පනතින් අවසන් වරට සංශෝධිත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වැනි වගන්තිය යටතේ, නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2012 පෙබරවාරි 27 දිනැති අංක 1747/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.06.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2012 අප්‍රේල් 04 දිනැති අංක 1752/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.06.19 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 5 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2012 මැයි 09 දිනැති අංක 1757/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.06.19 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනත යටතේ නියෝගය,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2012 මැයි 09 දිනැති අංක 1757/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.06.19 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) වගන්තිය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ එහි සාමාජිකයන්ගේ ඉන්ධන දීමනා 2012.05.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිවරයාට මාසිකව පෙට්‍රල් හෝ ඩීසල් ලීටර් 225ක් සහ එහි සාමාජිකයන්ට මාසිකව පෙට්‍රල් හෝ ඩීසල් ලීටර් 170ක් සැපයීමට හෝ එම ප්‍රමාණයට සමානව වෙළඳපලේ පවත්නා මිල ගණන්වලට අනුරූපව දීමනාවක් ගෙවීමට කටයුතු කළ යුතුයැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ එහි සාමාජිකයන්ට ගෙවිය යුතු ඉන්ධන දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් තීරණය කරන ලද ඉන්ධන දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් තීරණය කරනු ලබන ඉන්ධන දීමනා ආදේශ විය යුතුයැයි ද, මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2012 ජූලි මස 06 වැනි සිකුරාදා)

2073/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය සඳහා ලක් සතොස ආයතන වෙත පරිප්පු සපයනු ලැබූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ව්‍යාපාර නාමයන් කවරේද;

(ii) එම සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනයකර තිබේද;

(iii) එසේ නම්, එම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ටෙන්ඩරය අනුව සැපයුම්කරුවන් විසින් පරිප්පු සැපයීම සිදුකළ යුතු කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2074/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය සඳහා ලක් සතොස ආයතන වෙත සීනි සපයනු ලැබූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ව්‍යාපාර නාමයන් කවරේද;

(ii) එම සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනයකර තිබේද;

(iii) එසේ නම්, එම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ටෙන්ඩරය අනුව සැපයුම්කරුවන් විසින් සීනි සැපයීම සිදුකළ යුතු කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2075/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂය සඳහා ලක් සතොස ආයතන වෙත බිත්තර සපයනු ලැබූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ව්‍යාපාර නාමයන් කවරේද;

(ii) එම සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේද;

(iii) එසේ නම්, එම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ ටෙන්ඩරය අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම ටෙන්ඩරය අනුව සැපයුම්කරුවන් විසින් බිත්තර සැපයීම සිදුකළ යුතු කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2076/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ ලක් සතොස ආයතන පිහිටුවා ඇති ස්ථාන කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 වර්ෂය සඳහා ලක් සතොස ආයතන වෙත කුකුල් මස් සපයනු ලැබූ සැපයුම්කරු හෝ සැපයුම්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ව්‍යාපාර නාමයන් කවරේද;

(ii) එම සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනයකර තිබේද;

(iii) එසේ නම්, එම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ නම්, සහ ලිපිනයන් කවරේද;

(iv) එම ටෙන්ඩරය අනුව සැපයුම්කරුවන් විසින් කුකුල් මස් සැපයීම සිදුකළ යුතු කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2302/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 1990 සිට 2011 දක්වා කාල සීමාව තුළදී අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලබා දී ඇති පත්වීම් සංඛ්‍යාව එක් එක් තනතුරු නාමය අනුව, දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අවසන් වරට සිදුකරන ලද ගුරු වැටුප් සංශෝධනය අනුව ගුරු සේවයේ එක් එක් ශ්‍රේණිය සඳහා හිමි මූලික මාසික වැටුප වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) රජයේ ගුරුවරුන්ට මාසික වැටුපට අමතරව හිමිවන වරප්‍රසාද හා දීමනා ගුරු සේවයේ එක් එක් ශ්‍රේණිය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2303/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1990 සිට 2011 දක්වා කාල සීමාව තුළ ඩෙංගු වැළඳීම, රිය අනතුරු, සියදිවි නසා ගැනීම, ආහාර විෂවීම, කායික හෝ මානසික අතවරයන්ට ලක්වීම යන හේතු මත රෝහල්ගත කළ / මිය ගිය පාසල් ළමුන් සංඛ්‍යාව සහ ඔවුන් අයත් පාසල් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පසුගිය වර්ෂය තුළ විවිධ වරදවල් යටතේ චෝදනා ලබා ළමා අධිකරණයට යොමු කර ඇති පාසල් සිසුන් සංඛ්‍යාව, ඔවුන් අයත්වන වයස් කාණ්ඩය හා පාසල අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ජූලි මස 17 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0657/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) රට තුළ ඇති රජයට අයත් විශාලතම ව්‍යාපාර 30 කවරේද;

(ii) ඒවා රජය සතු විශාලතම ව්‍යාපාර 30 ලෙස සලකනු ලබන්නේ කවර පදනමකින්ද;

(iii) එක් එක් ආයතනයෙහි ආයෝජනය කරන ලද මූලධන ප්‍රමාණය හා දැනට සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) මේ දක්වා වූ පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් ආයතනයෙහි ලාභ හෝ පාඩු වාර්ෂික පදනමින් කොපමණද;

(v) රජය සතු, එක් එක් ව්‍යාපාරයෙහි වෙළඳපළ කොටස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ව්‍යාපාර අතරින් පාඩු ලබන සෑම ආයතනයක්ම ලාභ ලබන තත්ත්වයට පත් කළ හැකිද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1339/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තරුණ තරුණියන් වෙනුවෙන් ජාතික තරුණ සේවා සභාව විසින් පවත්වාගෙන ගිය ප්‍රාදේශීය යෞවන සම්පත් කේන්ද්‍රය භාවිතයට නොගෙන වර්ෂ කිහිපයක සිට වසා දමා ඇති බවත්;

(ii) එම හේතුවෙන් නායකයින් බිහිවීමට සහ වෘත්තීය හා ක්‍රීඩා කුසලතා ලබා ගැනීමට තරුණ තරුණියන්ට තිබූ අවස්ථාව අහිමි වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෙම සම්පත් කේන්ද්‍රය අත්හැර දැමීමට හේතු වූ බාධක කවරේද;

(ii) එම බාධක කඩිනමින් ඉවත්කර මෙම සම්පත් කේන්ද්‍රය ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ ප්‍රයෝජනය සඳහා ජනතා අයිතියට නැවතත් පැවරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1664/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010 වර්ෂයේ අග භාගයේදී සහ 2011 වර්ෂයේ මුල් කාල සීමාවේදී ලක් සතොස ආයතනය විසින් ඉන්දියාවෙන් ආනයනය කරන ලද කුකුල් මස් ප්‍රමාණය කොපමණද;

(ii) ආනයනය කරන ලද එක් මස් කිලෝවක් සඳහා ඉන්දියාවට ගෙවන ලද මුදල කොපමණද;

(iii) එම කුකුල් මස් ගබඩා කළ ස්ථාන කවරේද;

(iv) ගබඩා කළ ස්ථානයන්ගෙන් පරිභෝජනය සඳහා කුකුල් මස් නිදහස් කළ දිනය, ප්‍රමාණය සහ ලබාගත් ආයතන එක් එක් ගබඩාවලට අදාළව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) 2011 වර්ෂයේ ජූනි මස වන විට ඉහත කුකුල් මස් තොගවලින් ගබඩාවල ඉතිරිවී තිබූ ප්‍රමාණය කොපමණද;

(vi) එම ඉතිරි තොග සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2057/'11

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පසුගිය වර්ෂ දෙක තුළදී සේවක අර්ථසාධක අරමුදල විසින් කොළඹ කොටස් වෙළඳපලේ සිදුකරන ලද සියලුම ලැයිස්තුගත කොටස් මිලදීගැනීම් හා විකිණීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් ගනුදෙනුව සඳහා වගකීම දැරූ තැරැව්කරුවන්ගේ නම් කවරේද;

(iii) තැරැව්කාර ගාස්තු ද ඇතුළුව එක් එක් ගනුදෙනුවට අදාළ පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් වර්ෂ දෙකක කාල පරිච්ඡේදය සඳහා එක් එක් කොටස් තැරැව්කාර සමාගමට ගෙවන ලද තැරැව්කාර ගාස්තු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් එක් මිලදී ගැනීමට හෝ විකිණීමට සති දෙකකට පෙර සහ මිලදී ගැනීමෙන් හෝ විකිණීමෙන් සති දෙකකට පසු ඉහත (අ) (i) හි සඳහන් එක් එක් කොටසෙහි ඇවුරුම් මිල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2105/'11

ගරු රෝසි සේනානායක මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ළමුන් විවිධ ශ්‍රේණිවලදී පාසල් හැරයන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ පාසල් හැරයාමේ අනුපාතිකය කොපමණද;

(ii) එසේ පාසල් හැරයන සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පස්වැනි ශ්‍රේණියේදී පාසල් හැරයාමේ අනුපාතිකය කොපමණද;

(iv) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් පසු පාසල් හැරයාමේ අනුපාතිකය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) සිංහල හා දෙමළ මාධ්‍ය සිසුන් අතර පාසල් හැරයාමේ ප්‍රතිශතයන් වෙන් වෙන් වශයෙන් කවරේද?

(ඈ) (i) ශ්‍රී ලංකාවේ ළමුන් පාසල් හැර යාමට හේතු කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ ළමුන්ගේ පාසල් පැමිණීම දිරි ගැන්වීම සඳහා දැනට ක්‍රියාත්මක වැඩසටහන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2110/'11

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පිහිටි වාණිජ බැංකුවල, සේවක අර්ථසාධක අරමුදල මගින් හිමිකාරීත්වය දරන කොටස් හිමිකමේ වටිනාකම, එම එක් එක් බැංකුව අනුව කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් සමාගමේ කොටස් ප්‍රමාණයන් මිලදීගත් දිනයන් කවරේද;

(iii) එම එක් එක් සමාගමේ කොටස් හිමිකම මිලදීගනු ලැබුවේ කවර පුද්ගලයකු සහ/හෝ පුද්ගලයින්ගෙන්ද;

(iv) එම එක් එක් කොටස් ප්‍රමාණය මිලදීගනු ලැබූ වටිනාකම කවරේද;

(v) ඉහත සඳහන් අයුරින් මිලදීගත් කොටස් පසුව විකුණා ඇත්නම්, එම කොටස් විකුණූ මිල කවරේද සහ එම කොටස් විකුණනු ලැබුවේ කවර පුද්ගලයන්ටද;

(vi) එලෙස කොටස් හිමිකාරීත්වය දරන එක් එක් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා රජය සහ/හෝ සේවක අර්ථසාධක අරමුදල හෝ විසින් නම් කළ අයගේ නම්, තනතුරු සහ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2294/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2000, 2001, 2002, 2003 සහ 2011 යන වර්ෂයන්හිදී වසා දමන ලද මධ්‍යම රජයේ සහ පළාත් සභා පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද?

(ආ) යම් පාසලක් වසා දැමීමේදී,

(i) එම පාසලේ සිසුන් සහ ගුරුවරුන් සම්බන්ධයෙන් ගන්නා විකල්ප ක්‍රියමාර්ගය කවරේද;

(ii) සැලකිල්ලට ගන්නා වූ නිර්ණායකයන් කවරේද;

(iii) එම සැලකිල්ලට ගන්නාවූ නිර්ණායකයන් මේ වන විට වසා දමා ඇති පාසල් සම්බන්ධයෙන් අනුගමනය කර තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2011 වර්ෂය වන විට වසා දමා ඇති පාසල්වල ගොඩනැගිලි කිසියම් ඵලදායි කාර්යයක් සඳහා මේ වන විට යොදවා තිබේද;

(ii) එසේ නම්, යොදවා ඇති එම කාර්යයන්ගේ ස්වභාවයන් සහ එමගින් උපයන වාර්ෂික ආදායම කවරේද;

(iii) ඵලදායී කාර්යයක යොදවා නොමැති පාසල් ගොඩනැගිලි සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2610/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මුත්තෙට්ටුගල කාති උසාවියක් පිහිටුවීමට පියවර ගෙන තිබේද;

(ii) කුරුණෑගල බසාර් මුස්ලිම් පල්ලියේ භාරකරුවන් විසින් එම පල්ලියට අයත් අක්කර 10ක ඉඩමක් ඒ සඳහා ලබාදී තිබේද;

(iii) එම උසාවි ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කුවේට් රාජ්‍යයෙන් මුදල් ආධාර ලබාගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මෙම කාති උසාවිය ඉදිකිරීමට කොපමණ කාලයක් ගතවේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2612/'12

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව අධ්‍යාපන විද්‍යා පීඨයේ ශාරීරික අධ්‍යාපන පාඨමාලාව සඳහා පසුගිය කාලයේදී වාර්ෂිකව සිසුන් 120 දෙනෙකු බඳවා ගෙන ඇති බවත්;

(ii) ප්‍රතිපාදන කප්පාදුව හේතුවෙන් 2012 වර්ෂයේදී එම විද්‍යාපීඨයට බඳවාගෙන ඇත්තේ සිසුන් 60ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දිවයිනේ සමස්ත පාසල් පද්ධතිය තුළ ශාරීරික අධ්‍යාපන ගුරුවරු සඳහා පුරප්පාඩු පවතින බවත්;

(ii) 2012 වර්ෂයේදී උසස් අධ්‍යාපන විද්‍යාපීඨයට බඳවාගත් ශාරීරික අධ්‍යාපන සිසුන්ගේ සංඛ්‍යාව අඩකින් අඩුකිරීම හේතුවෙන් ඉහත සඳහන් පුරප්පාඩු සපුරාලීමේ ඉලක්කය සපුරාගත නොහැකි වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ශාරීරික අධ්‍යාපන පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ඇති, උසස් පෙළ ඇතුළුව දිවයින පුරා සිටින සිසුන්ට ඉහත තත්ත්වය නිසා මෙම වර්ෂයේදී සිදුවූ අසාධාරණය මඟහැරවීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2633/'12

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති පිළිගත් දේශපාලන පක්ෂ සංඛ්‍යාව කොපමණද;

(ii) එම දේශපාලන පක්ෂ අතුරින් විදේශ රටවලින් මුදල් ලබා ගන්නා දේශපාලන පක්ෂ තිබේද;

(iii) විදේශ රටවලින් මුදල් ලබාගන්නා එම දේශපාලන පක්ෂ පිළිබඳ අධීක්ෂණයක් සිදුවන්නේද;

(iv) එසේ නම්, එය සිදුකරනු ලබන ආයතනය කවරේද;

(v) විදේශ රටවලින් මුදල් ලබාගන්නා දේශපාලන පක්ෂ එම මුදල් ලබාගන්නා ක්‍රමවේද පිළිබඳ අධීක්ෂණයක් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1133/'11

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් සේවා සපයනු ලබන සමස්ත විදුලි පරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයෙන් සේවය ලබා ගන්නා පාරිභෝගිකයන් අතරින් ගෘහස්ථ, රජයේ ආයතන, කාර්මික ආයතන, ආගමික ආයතන සහ වෙනත් යන කාණ්ඩවලට අයත්වන පාරිභෝගික සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් පාරිභෝගික කාණ්ඩයේ විදුලි පරිභෝජනය සමස්ත නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා වූ පසුගිය වර්ෂ තුනක කාලය තුළ ඉහත (අ)(ii) හි සඳහන් පාරිභෝගික කාණ්ඩවලින් අයකරන ලද විදුලිය සඳහා වූ ගාස්තු ප්‍රමාණයන් කවරේද;

(ii) ඉහත සඳහන් කාල සීමාව තුළ ගාස්තු ප්‍රමාණයන්හි වෙනස්කම් ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2011 ජනවාරි මස සිට මේ දක්වා ලංකා විදුලිබල මණ්ඩලය මසකට ලැබූ පාඩුව කොපමණද;

(ii) ඉහත සඳහන් විදුලි පාරිභෝගික කාණ්ඩ එකිනෙක මගින් ලංකා විදුලිබල මණ්ඩලය ලැබූ පාඩුවට දායක වී ඇති ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස හා තථ්‍ය වටිනාකම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1350/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, වලවෙවත්ත පාරේ, ඕලුවිල සහල් පිටි ආශ්‍රිත කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමට මුල්ගල් තබා ඇතත්, එම ව්‍යාපෘතිය අතරමග නවතා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතිය නවතා දැමීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම කර්මාන්ත ශාලාව කඩිනමින් ආරම්භ කොට ප්‍රදේශයේ ජනතාව අතර සහල් පිටි ජනප්‍රිය කරවීම සඳහා කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, මෙම ගොඩනැගිලි සහ භූමිය වෙනත් කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1864/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේදී ශ්‍රී ලංකාවේ පැවති තරඟ සඳහා සහභාගී වූ දේශීය හා විදේශීය ක්‍රීඩකයින්හට නවාතැන් පහසුකම් සපයන ලද නවාතැන්පල කවරේද;

(ii) එම නවාතැන්පල පිහිටි ස්ථාන කවරේද;

(iii) එම එක් එක් නවාතැන්පලෙහි ලැගුම් ගත් කණ්ඩායම් කවරේද;

(iv) එකී එක් එක් ස්ථානය ක්‍රීඩකයින් වෙනුවෙන් වෙන් කළ දින ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එකී එක් එක් ස්ථානය සඳහා වැයකළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) මේ වන විට එකී නවාතැන්පල සඳහා සියලු ගෙවීම් සිදු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත අ(vi) ට අනුව සියලු ගෙවීම් සිදු කර නොමැති නම්, මුදල් ගෙවීමට ඇති නවාතැන්පල හා ගෙවීමට ඇති මුදල එක් එක් ස්ථානය අනුව, වෙන් වශයෙන් කවරේද;

(ii) මුදල් ගෙවීම් නියමිත පරිදි සිදු නොවූයේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1187/'11

ගරු රවි කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) සමස්ත සුදුළූණු පරිභෝජනය සහ ඒක පුද්ගල සුදුළූණු පරිභෝජනය කවරේද;

(ii) දේශීය වශයෙන් නිෂ්පාදනය කරන සුදුළූණු ප්‍රමාණය සහ එක් සුදුළූණු කිලෝග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය කොපමණද;

(iii) ආනයනය කළ ප්‍රමාණය කොපමණද;

(iv) ආනයනය කළ සුදුළූණු ප්‍රමාණයේ වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2080/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගලේවෙල නගර සංවර්ධන සැලැස්ම යටතේ කොළඹ - ත්‍රිකුණාමලය මාර්ගය පුළුල් කිරීමේ කටයුතු සඳහා නගර සීමාව තුළ ඉඩම් අත්පත් කරගත් දිනය කවරේද;

(ii) පවරාගත් එම ඉඩම් සහ දේපල වෙනුවෙන් වන්දි ගෙවා තිබේද;

(iii) වන්දි ලබා ගැනීම සඳහා අයදුම්කළ සංඛ්‍යාව කොපමණද;

(iv) වන්දි ලබා දීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(v) මේ වන විට ගෙවා ඇති වන්දි මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පවරාගත් ඉහත ඉඩම් සහ දේපල වෙනුවෙන් මේ වන විටත් වන්දි නොලැබූ අයදුම්කරුවන් සිටී නම්, ඔවුන්ගේ සංඛ්‍යාව සහ ගෙවිය මුදල් ප්‍රමාණය කවරේද;

(ii) ඔවුන්ට වන්දි නොගෙවීමට හේතු කවරේද;

(iii) ඔවුන් වෙනුවෙන් වන්දි ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ජූලි මස 18 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0686/'10

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2010 සැප්තැම්බර් 01 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව මගින් වෙන්දේසි කරනලද ශ්‍රී ලංකා රජයේ රන් සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) එසේ වෙන්දේසි කරන ලද රත්තරන්වල වටිනාකම එක්සත් ජනපද ඩොලර්වලින් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජය විසින් රත්තරන් මිලදී ගැනීමට ගෙවූ මිල ගණන් කවරේද;

(iv) රාජසන්තක කරන ලද රත්තරන් ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ රන් සංචිතවලට එක් කරනු ලැබුවේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයට අයත් රත්තරන් ප්‍රමාණයක් පසුගිය වසර දෙක තුළ විකුණනු ලැබුවේද;

(ii) එසේ නම්, එම රත්තරන්වල අලෙවි මිල කවරේද;

(iii) එම රත්තරන් විකිණීම ටෙන්ඩර් කැඳවීමක් හෝ වෙන්දේසි කිරීමක් මගින් සිදුකරන ලද්දේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1352/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර, කුරුවිට, මහවත්ත කන්ද සිට තැනීපිට තේ ජනපදය දක්වා විදුලිය ලබා දීම සඳහා විදුලි පරිණාමකයක් (Transformer) ස්ථාපිත කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි පරිණාමකය (Transformer) සවි කර තිබියදීත් තැනීපිට තේ ජනපද ප්‍රදේශයේ ජනතාවට විදුලිය ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම ප්‍රදේශයේ ජනතාවට විදුලිය ලබා දීම සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) විදුලිය ලබා දෙන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1865/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂයේදී කොරියානු රජය විසින් ශ්‍රී ලංකාවට ලබා දීමට ගිවිසුම්ගත රැකියා අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා කොරියාවෙන් මෙරටට ගෙන්වූ ඉල්ලුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iii) මුල් අවස්ථාවේදී බෙදා දුන් ඉල්ලුම්පත් සංඛ්‍යාව කොපමණද;

(iv) ගෙන්වන ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව ඉල්ලුම්කරුවන්හට ලබා දීමට ප්‍රමාණවත් වූයේද;

(v) නොඑසේ නම්, නැවත කොරියාවෙන් ඉල්ලුම්පත් මෙරටට ගෙන්වූයේද;

(vi) අමතරව අවශ්‍යවූ එම ඉල්ලුම්පත් මෙරටදී මුද්‍රණය කළේ නම්, ඒවා මුද්‍රණය කළ ආයතනය කුමක්ද;

(vii) එම ආයතනය රාජ්‍ය ආයතනයක් නොවේ නම්, එහි අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) කොරියාවේ රැකියා අවස්ථාවන් සඳහා බඳවා ගන්නා ක්‍රියාපටිපාටිය කුමක්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2023/'11

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන මගින් 2010 හා 2011 වර්ෂ තුළදී නිලධාරීන්ට ලබා දී ඇති විදේශ ශිෂ්‍යත්ව කවරේද;

(ii) එම ශිෂ්‍යත්ව ලබා දී ඇති නිලධාරීන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2106/'11

ගරු රෝසි සේනානායක මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ වතුකරයේ දැනට ක්‍රියාත්මක වන,

(i) රජයේ පාසල් සංඛ්‍යාව, ඉගැන්වීම් කෙරෙන මාධ්‍ය අනුව දිස්ත්‍රික් පදනමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ජාතික පාසල්, පළාත් සභා පාසල්, නවෝද්‍යා පාසල් සහ ඉසුරු පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ප්‍රාථමික හා ද්විතියික පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) ද්විතියික පාසල් 1000 ව්‍යාපෘතියට අයත් වන පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 5 ක කාලය තුළ වතුකරයේ සිසුන්ගේ 5 වසර, සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ ප්‍රතිඵල දිස්ත්‍රික් මට්ටමින් හෝ කලාප මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වතුකරයේ ළමුන්ට ඉහළ ප්‍රතිඵල ලබාගත හැකි තත්ත්වයක් උදාකිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2295/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වන විට අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මානව සහ භෞතික සම්පත් සංවර්ධන ව්‍යාපෘතීන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම එක් එක් ව්‍යාපෘතියෙහි,

(i) මුඛ්‍ය අරමුණ;

(ii) ආරම්භ කළ වර්ෂය සහ නිම කිරීමට යෝජිත වර්ෂය;

(iii) ඇස්තමේන්තුගත මුළු මුදල;

(iv) විදේශීය ආධාර ලැබෙන්නේ නම්, ඒවා ලබා දෙන ආයතනය සහ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන්;

(v) රජය වෙන්කළ මුදල් ප්‍රමාණය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1063/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) චීනය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියා සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර සහයෝගීතාව සඳහාවූ ජපාන බැංකුව සහ යුරෝපා සංගමය යනාදී රටවල් සහ ආයතන විසින් පසුගිය වර්ෂ 15 තුළ ලබාදී ඇති ණය හෝ ප්‍රදාන වෙනුවෙන් එකී ණය මුදල් හෝ ප්‍රදානයන් ගෙවා නිමවෙන දිනය වන විට ගෙවිය යුතු සමස්ත මුදල් ප්‍රමාණය ඇ.එ.ජ. ඩොලර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එකී ණය මුදල් ආපසු ගෙවීමේ සාමාන්‍ය කාලසීමාව එක් එක් රට හෝ ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1353/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, බිබිල අධ්‍යාපන කලාපයට අයත්, මැදගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලෙහි වහලය දිරාපත් වී විනාශ වී යාමේ තර්ජනයට මුහුණපා ඇති බවත්;

(ii) එම තත්ත්වය කාර්යාලයේ සේවකයින්ගේ ජීවිතවලට අනතුරුදායක මෙන්ම පරිපාලන කටයුතු අඩාළ කිරීමටද හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කාර්යාල ගොඩනැගිල්ල කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

(iii) ඒ සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, ඒ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2081/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පසුගිය කාල සීමාවේදී ආනයනය කරන ලද බාල පෙට්‍රල් තොගයෙන් ඉන්ධන පිරවුම්හල් වෙත නිදහස් කර ඇති පෙට්‍රල් ප්‍රමාණය කොපමණද;

(ii) එම තොගයෙන් නිදහස්කර නොමැති ප්‍රමාණය කොපමණද;

(iii) නිදහස් නොකරන ලද එම ඉන්ධන ප්‍රමාණයේ වටිනාකම කොපමණද;

(iv) බාල ඉන්ධන බව සහතික කර ගැනීමෙන් පසු ඉතිරි තොගයෙන් ඉන්ධන නිදහස් කිරීමක් කර තිබේද;

(v) ඉතිරි ඉන්ධන තොගය සම්බන්ධයෙන් ගන්නා හෝ මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2288/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෝමාගම පිටිපන මහින්ද රාජපක්ෂ විද්‍යාලය ඉදිකිරීමට ඉඩම් පවරා ගත් දිනය කවරේද;

(ii) එම ඉඩම් පවරා ගැනීම සිදු කළ බලයලත් නිලධාරියා කවුරුන්ද;

(iii) එම ඉඩමේ මහින්ද රාජපක්ෂ විද්‍යාලය ඉදිකිරීමට ප්‍රථම පදිංචිකරුවන් සිටියේද;

(iv) 1/7 බී, පිටිපන උතුර, හෝමාගම ලිපිනයෙහි වර්ෂ 35ක සිට පදිංචිව සිටින එම්. ඒ. අනුර මහතාගේ ඉඩමද ඉහත කටයුත්ත සඳහා පවරාගෙන තිබේද;

(v) එම ඉඩම් පවරා ගැනීමේදී පදිංචිකරුවන්ට ලබාදුන් සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පවරාගෙන ඇති ඉහත ඉඩමේ පදිංචිකරුවන්ගේ විදුලිය මේ වනවිට විසන්ධිකර ඇති බවත්;

(ii) ඔවුන් විසින් පාවිච්චි කරමින් සිටි ළිඳ වසා දමා ඇති බවත්;

(iii) එම ඉඩම් පවරා ගැනීමෙන් පසුව මතුව ඇති ඉහත තත්ත්වයන් නිසා එහි පදිංචිව සිටි පුද්ගලයන්ගේ ජීවත්වීමේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2296/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඉසුරු පාසල් හා නවෝද්‍යා පාසල් ව්‍යාපෘති,

(i) ආරම්භ කළ වර්ෂයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ආරම්භ කිරීමේ පරමාර්ථයන් කවරේද;

(iii) මේ වන විටත් එම ව්‍යාපෘතීන් වෙන් වෙන් වශයෙන් ක්‍රියාත්මක වේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉසුරු පාසල් හා නවෝද්‍යා පාසල් ව්‍යාපෘති සඳහා,

(i) යොදවා ඇති දේශීය අරමුදල් ප්‍රමාණය;

(ii) යොදවා ඇති විදේශ අරමුදල් ප්‍රමාණය;

(iii) විදේශ අරමුදල් ලබා දී ඇති ආයතන, ලබා දුන් මුදල සහ වර්ෂයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත ව්‍යාපෘති යටතේ,

(i) ආරම්භ කළ වර්ෂයේ සිට මේ දක්වා සංවර්ධනය කළ පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

(ii) ඉදිරි වර්ෂ දහය තුළ සංවර්ධනය කිරීමට අපේක්ෂිත ඉසුරු හා නවෝද්‍යා පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ද්විතීයික පාසල් දහසේ ව්‍යාපෘතියට ඇතුළත්වන ඉසුරු හා නවෝද්‍යා පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික්ක මට්ටමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1200/'11

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2007, 2008, 2009 සහ 2010 වර්ෂවලදී ශ්‍රී ලාංකිකයින් රැකියා සඳහා ගිය රටවල නම් කවරේද;

(ii) ඉහත සඳහන් වර්ෂවලදී රැකියා සඳහා මෙම රටවලට ගිය ස්ත්‍රීන් සහ පුරුෂයින් සංඛ්‍යාව එක් එක් වර්ෂය සහ එක් එක් රට අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් විසින් උපයාගත් සාමාන්‍ය වැටුප කොපමණද;

(iv) ඔවුන්ට ලැබෙන වැටුපෙහි අවම වැටුප් මට්ටමක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1359/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්, වැත්තෑවේ කාබනික පොහොර නිෂ්පාදනාගාරය, ජනාකීර්ණ මාවතක් ආසන්නයේ ස්ථාපිත කර ඇති බවත්;

(ii) ඒ හේතු කොට ගෙන ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍යයට දැඩි තර්ජන එල්ලවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත තත්ත්වය සලකා බලා එම කාබනික පොහොර නිෂ්පාදනාගාරය ජනශූන්‍ය ප්‍රදේශයක පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වන විට සැලසුම් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එය නැවත ස්ථාපනය කිරීමට යෝජිත ස්ථානය කවරේද;

(iv) එම ස්ථානයේ පොහොර නිෂ්පාදනාගාරය ස්ථාපිත කිරීමට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2082/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේදී ලොකු ළූණු වගා කිරීම සඳහා ගොවීන්ට ලබා දුන් බීජ ප්‍රරෝහණය නොවීමේ හේතුව මත වගා අසාර්ථකවීම නිසා ඔවුන්ට සිදු වූ පාඩුව ගණනය කර තිබේද;

(ii) ඒ අනුව අක්කරයකට ලොකු ළූණු වගාවෙන් සිදු වූ පාඩුව කොපමණද;

(iii) බීජ ප්‍රරෝහණය නොවීම නිසා හානියට පත්වූ ලොකු ළූණු වගා බිම් අක්කර සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත තත්ත්වය නිසා පීඩාවට පත් ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත පරිදි වගා හානි වූ ගොවීන් සඳහා වන්දි ගෙවා අවසන්කර තිබේද;

(ii) එසේ නම්, අක්කරයක් සඳහා ගෙවන ලද වන්දි මුදල කොපමණද;

(iii) වන්දි ගෙවා නොතිබේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ප්‍රරෝහණය නොවුණු ලොකු ළූණු බීජ ආනයනය කරන ලද ආයතනයේ හෝ ආයතනවල විස්තර කවරේද;

(ii) එම ආයතනවලට තත්ත්වයෙන් බාල බීජ ගෙන්වීම සඳහා අවසර ලබාදුන් අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2297/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්වවිද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල සිසුන්ට මහපොළ ශිෂ්‍යත්වය ලබා දීමේදී සලකා බලන දෙමාපියන්ගේ වාර්ෂික ආදායම් සීමාව කවරේද;

(ii) මහපොළ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් එම ආදායම් සීමාව අවසන් වරට සංශෝධනය කරන ලද වර්ෂය කවරේද;

(iii) මහපොළ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් එම සංශෝධනය කිරීමට පෙර පැවති එම ආදායම් සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ජූලි මස 19 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0691/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භ වූ දින සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු පිහිටුවීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම එක් එක් බැංකුවේ ප්‍රධාන ශාඛාව යටතේ ක්‍රියාත්මක වන බැංකු ශාඛා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත බැංකුවල ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය කොපමණද;

(iv) අද වන විට වාණිජ බැංකුවලට අවශ්‍ය වන කොටස් ප්‍රාග්ධන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත බැංකු අතරින් ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ තිබෙන කවර හෝ බැංකුවක් විදේශීය බැංකුවක් මිලදී ගැනීමට මුදල් ගෙවා තිබේද;

(ii) එසේ නම්, එම බැංකුවේ නම සහ එම බැංකුව මගින් අනුමත කර ඇති මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වාණිජ නොවන බැංකු සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන වාණිජ නොවන බැංකු සංඛ්‍යාව කොපමණද;

(iii) එම බැංකුවල කොටස් ප්‍රාග්ධනය කොපමණද;

(iv) යම්කිසි වාණිජ හෝ වාණිජ නොවන බැංකුවක් බංකොළොත් තත්ත්වයට පත්වී තිබේද;

(v) එසේ නම්, එම බැංකුවල සහ ඒවායේ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1364/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, මඩල - දම්මුල්ල - කරදින ප්‍රධාන මාර්ගයේ කිලෝමීටර් තුනක පමණ දුර ප්‍රමාණයක් කාපට් අතුරා සංවර්ධනය කර ඇති බවත්;

(ii) එම සංවර්ධන කටයුතු නිසි ප්‍රමිතියෙන් තොරව සිදු කර ඇති බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත මාර්ගයේ කිලෝමීටර් 3 ක දුර ප්‍රමාණය සංවර්ධනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(ii) කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීමට පෙර අදාළ කාර්මික නිලධාරී වාර්තාව ලබා ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් සංවර්ධන කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1868/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සේවය කරන ස්ථිර සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ටෙලිකොම් ආයතනයේ දිවයින පුරා ඇති ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන ස්ථිර සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා මාසිකව ලබන වැටුප, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ආයතනයේ අනෙකුත් විධායක ශ්‍රේණියේ නිලධාරීන් මාසිකව ලබන වැටුප්, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2298/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ සිදුකරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා එම එක් එක් ප්‍රතිසංස්කරණය ගෙන ඒම සඳහා මුඛ්‍ය වූ අරමුණු වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) උක්ත එක් එක් ප්‍රතිසංස්කරණය යටතේ පාසල් විෂය නිර්දේශ සම්බන්ධයෙන් සිදුකර ඇති සංශෝධනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2628/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මීට වර්ෂ 5 ට පමණ පෙර පුළුල් කර ප්‍රතිසංස්කරණය කරන ලද අම්පාර ප්‍රධාන මාර්ගයෙහි විදුලි කණු ඉවත් කොට සුදුසු ස්ථානවල පිහිටුවා නොතිබීමෙන් එම මාර්ගයේ,

(i) වාහන ගමනාගමනය අපහසුවී ඇති බවත්;

(ii) පදිකයින් මහත් අපහසුතාවයන්ට මුහුණ දෙන බවත්;

(iii) වාහන අනතුරු බහුලවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අම්පාර ප්‍රධාන මාර්ගයේ ඇති ඉහත තත්ත්වය නිවැරදි කර එම මාර්ගය භාවිතා කරන්නන්ගේ පහසුව සලසා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0993/'10

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ගෑස් සමාගම සීමාසහිත ෂෙල් සමාගමට විකුණනු ලැබූ දිනය කවරේද;

(ii) එලෙස විකුණනු ලැබූ කොටස්වල මිල සහ ප්‍රතිශතය කොපමණද;

(iii) ගෑස් සමාගම විකුණන අවස්ථාවේදී සිටි ජනාධිපතිවරයාගේ නම සහ බලයේ සිටි රජය කවරේද;

(iv) විකුණනු ලැබූ දිනයේ සිට නැවත මිලදී ගත් දිනය දක්වා කාලය තුළ රජයට ලැබුණු ලාභාංශ ප්‍රමාණය කොපමණද;

(v) ෂෙල් ටර්මිනල් සමාගම තුළ රජය සතු කොටස් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සීමාසහිත ෂෙල් සමාගම සතු කොටස් නැවත මිලදී ගැනීම සඳහා රජය විසින් ගෙවනු ලැබූ මිල කවරේද;

(ii) රජය විසින් නැවත මිලදී ගත් කොටස් ප්‍රතිශතය කොපමණද;

(iii) ඉහත සඳහන් නැවත මිලදී ගැනීම සිදු කරන ලද දිනය කවරේද;

(iv) මිල තක්සේරුව සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණි ක්‍රමය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1370/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, වැලිගම, කප්පරතොට, "දර්ශන" හි පදිංචි එස්. ටී. කේ. ජයවීර මහතා ඇතුළු සහෝදරයින්ට අයත් වැලිගම, කප්පරතොට, නව ගාලු පාරේ අංක 153/1 දරන තනිගහවත්ත නමැති ඉඩමේ පර්චස් 18.235 පමණ ප්‍රමාණයක් වැලිගම නගර සභාව මගින් පවරා ගෙන ඇති බවත්;

(ii) එම පවරාගැනීම සිදුකොට වර්ෂයකට ආසන්න කාලයක් ගතවී ඇතත්, මේ දක්වා වන්දි මුදලක් ගෙවා නොමැති බවත්;

(iii) ගැසට් නිවේදනයක් මගින් පවරා ගන්නා ලද ඉහත ඉඩමට අමතරව එස්. ටී. කේ. ජයවීර මහතා ඇතුළු සහෝදරයින්ට අයත් ඒ අවට ඉඩම් ද හසුවන සේ වැලිගම නගර සභාව මේ වනවිට ගොඩනැගිලි ඉදිකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පවරාගත් ඉඩම වෙනුවෙන් මෙතෙක් වන්දි මුදල් නොගෙවීමට හේතු කවරේද ;

(ii) වන්දි මුදල ගෙවන්නේ නම්, ඊට ගතවන කාලය කවරේද;

(iii) වන්දි ලෙස ගෙවන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අ (iii) හි සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා යොදාගත් ඉඩම් කොටස් සඳහා ද වන්දි මුදලක් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම වන්දි මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2083/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— ගොවිජන සේවා සහ වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෝධ වැවේ අභය භූමිය ප්‍රදේශයට අයත් රක්ෂිත ප්‍රදේශයේ කොටසක් එළිපෙහෙළි කර තිබේද;

(ii) එසේ නම්, එම භූමි ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත අභය භූමි ප්‍රදේශය එළිපෙහෙළි කිරීම සිදුකළ අය කවුරුන්ද;

(iv) එය සිදු කිරීමට හේතු කවරේද;

(v) ඒ සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පාරිසරික අනුමතිය ලබාගෙන තිබේද;

(vi) එසේ නම්, එම අවසරපත් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(vii) එම බිම් කොටස යෝධ වැවේ ජල පෝෂක ප්‍රදේශයට අයත්වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2299/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2011 දක්වා වතුකරයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මකකර ඇති වැඩසටහන් කවරේද;

(ii) එම එක් එක් වැඩසටහන සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වතුකරයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් මෑතකාලයේදී කටයුතු කර ඇති විවිධ රාජ්‍ය නොවන ආයතන කවරේද;

(ii) ඒ ඒ ආයතනය විසින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් හා ඒවා සඳහා යොදවා ඇති මූල්‍යමය වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2629/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෙල්ලාවෙලි කොට්ඨාසයට අයත් පෝරතීව්පට්රු හි ගාන්ධිපුරම් ගම්මානයේ වෙසෙන පවුල් 214කට පමණ අයත් පුද්ගලයන් 800කට වැඩි පිරිසක් පානීය ජලය ලබාගැනීමේ දැඩි දුෂ්කරතාවකට මුහුණදී සිටින බවත්;

(ii) එම ප්‍රදේශයේ ළිං ජලය කිවුල් රසයකින් යුක්ත බවත්;

(iii) පානීය ජල පහසුකම් සලසා දෙන ලෙස එම ප්‍රදේශයේ ජනතාව ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ප්‍රදේශයේ පවතින පානීය ජල පහසුකම් ගැටලුව විසඳීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1306/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ 10 තුළ වාර්ෂික පදනමින් රටට ලැබුණු මුළු ප්‍රේෂණ ප්‍රමාණය ඇමරිකානු ඩොලර් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද;

(ii) එම ප්‍රේෂණ ලැබුණු රටවල නම් කවරේද;

(iii) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී ඉහත සඳහන් එක් එක් රටවලින් එක් පුද්ගලයකුට ලැබුණු සාමාන්‍ය ප්‍රේෂණ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) විදේශ සංචිත ආරක්ෂා කර ගැනීමට උපකාරීවන පුරවැසියන්ට ලබාදෙන ප්‍රතිලාභ කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1396/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලතොට ප්‍රදේශයේ පිහිටා ඇති දංගහ ඇළ පාලම ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් දැඩි අනතුරුදායක තත්ත්වයක් ඇති වී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

(iii) මේ වන විට ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2114/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය, ඉදිකිරීම් කර්මාන්ත සභාව සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමය ඒකාබද්ධ හවුල් ව්‍යාපාරවලට එළැඹීමට ලබා දුන් කැබිනට් අනුමතිය අනුව ස්ථාපනය කරනලද සීමා සහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගම ලියාපදිංචි කරන ලද දිනය කවරේද;

(ii) එම සමාගම තුළ ඇති මාර්ග සංවර්ධන අධිකාරිය, ඉදිකිරීම් කර්මාන්ත සභාව සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමය සතු කොටස් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සමාගම ලියාපදිංචි කළ කාල සීමාවේ දී ඉහත ආයතනවලට අමතරව වෙනත් පුද්ගලයින්ට හෝ ආයතනවලට කොටස් ලබා දී තිබේද;

(iv) එසේ ලබා දී තිබේ නම්, ඔවුන්ගේ නම්, ලිපිනයන් සහ එක් එක් පුද්ගලයා හෝ ආයතනය සතු කොටස් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගමේ වත්මන් කොටස් හිමියන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(vi) එම සමාගම ස්ථාපිත කළ වර්ෂයේ සිට අද දක්වා කොටස් මිලදී ගත් සහ මිලදී ගත් කොටස්වලින් ඉවත් වූ එක් එක් කොටස් හිමියාගේ නම, ලිපිනය සහ කොටස් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2306/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 සහ 2011 වර්ෂවලදී වයස අවුරුදු පහ හෝ ඊට අඩු දරුවන් සමග බන්ධනාගාරගත වූ මව්වරුන් සංඛ්‍යාව, වරදේ ස්වභාවය හා බන්ධනාගාරගත වූ කාල සීමාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2011 වන විට එම මව්වරුන් සමග සිටි දරුවන් සංඛ්‍යාව, ඔවුන්ගේ වයස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බන්ධනාගාරය තුළ මව සමග සිටින දරුවන්ගේ රැකවරණය හා සංවර්ධනය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගයන් කවරේද;

(ii) වර්ෂ 2000 සිට 2011 දක්වා එක් එක් වර්ෂය තුළ ඉහත සඳහන් කටයුතු වෙනුවෙන් වෙන්කර තිබූ මුදල් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයේ හෝ විවිධ රාජ්‍ය නොවන ආයතනවල මූල්‍යාධාර යටතේ බන්ධනාගාරය තුළ සිටින දරුවන් සහ කාන්තාවන් වෙනුවෙන් ක්‍රියාත්මක වන සුභසාධන වැඩසටහන් කවරේද;

(ii) 2010 වර්ෂයේදී එම එක් එක් ආයතනය විසින් බන්ධනාගාරය තුළ කාන්තාවන්ගේ හා දරුවන්ගේ සංවර්ධනයට යොදවා ඇති මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2630/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ, වෙල්ලාවෙලි ප්‍රදේශයේ, ගාන්දිපුරම් ගම්මානයේ පිහිටි කලෛමගල් විද්‍යාලයේ,

(i) පන්ති පවත්වනුයේ 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා පමණක් බවත්;

(ii) භෞතික සම්පත්වල පවතින අඩුපාඩු සම්පූර්ණ කරදෙන මෙන් එම ගම්වාසීන් ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගාන්දිපුරම් ගම්මානයේ කලෛමගල් විද්‍යාලයට භෞතික සම්පත් ලබා දීමටත්;

(ii) එම පාසල සාමාන්‍ය පෙළ දක්වා පන්ති පැවැත්වෙන පාසලක් දක්වා උසස් කිරීමටත්;

කඩිනමින් කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2012 ජූලි මස 20 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0851/'10

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2009 සහ 2010 වර්ෂවල දේශීය සහල් පරිභෝජනය කොපමණද;

(ii) 2011 සහ 2012 වර්ෂවල පරිභෝජනය සඳහා අවශ්‍යවේ යැයි ගණන් බලා ඇති සහල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 පෙබරවාරි මස සහල් මෙට්‍රික් ටොන් 100,000 ආනයනය කළ රජයේ ආයතනයන්හි නම් කවරේද;

(ii) ඉහත ආනයනයන් සඳහා මුදල් ලැබුණු මූලාශ්‍ර කවරේද;

(iii) මෙසේ ආනයනය කරන ලද සහල්වල ආනයනික මිල, විකුණුම් මිල, අලෙවි කරන ලද ප්‍රමාණය සහ ගබඩා කර තිබෙන ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ආනයනය කරන ලද සහල් කිලෝග්‍රෑමයක මිල රු. 65/= ට වඩා වැඩියෙන් තිබියදී, මෙසේ ආනයනය කරන ලද සහල් මෙට්‍රික් ටොන් 30,000ක් පමණ එක් කිලෝග්‍රෑමයක් රු. 31/= බැගින් 2010 සැප්තැම්බර් මාසයේදී පෞද්ගලික අංශයට අලෙවි කර ඇති බවත්,

(ii) මෙම සහල් දේශීය වෙළඳපලෙහි අලෙවි නොකරන ලෙසට රජය අවධාරණය කර තිබුණද, පෞද්ගලික වෙළෙඳුන් ඒවා දේශීය වෙළඳපලෙහි අලෙවි කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) මෙසේ සහල් අලෙවි කළ පෞද්ගලික වෙළෙඳුන්ට එරෙහිව ගන්නා ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1567/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අම්පාර දිස්ත්‍රික්කයට අයත්, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහඔය සිට පොල්ලේබැද්ද දක්වා මාර්ගය සම්බන්ධ කරමින් ඉදිකර ඇති යකඩ පාලම දිරාපත්ව, අබලන් වී ඇති බැවින් ජන ජීවිත දැඩි අවදානමට ලක්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, වෙන් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1869/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පාරිභෝගික දුරකථන සම්බන්ධතාවලින් ලැබූ ආදායම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් පාරිභෝගිකයින් වෙත රැහැන් රහිත ස්ථාවර දුරකථන (CDMA) ලබා දීම ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) අද වන විට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් ලබා දුන් CDMA දුරකථන භාවිතා කරන පාරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතනය CDMA දුරකථන ලබාදීම ආරම්භ කළ දින සිට මේ දක්වා එමගින් ලැබූ ආදායම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ටෙලිකොම් ආයතනය විසින් ආරම්භයේදී CDMA දුරකථන සම්බන්ධතාවයක් ලබා දුන් මිල සහ එම දුරකථන සම්බන්ධතාවයක් ලබා දෙන වත්මන් මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1911/'11

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2001 මැයි මස කැබිනට් අනුමතිය ලැබුණු "ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීමේ ජාතික ප්‍රතිපත්තියේ" නියමයන්ට අනුකූලව;

(i) ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීම් සිදු කරන්නේ එය නොවැළැක්විය හැකි වුවහොත් පමණක් බවත්;

(ii) නැවත පිහිටුවීමේ ස්ථාන තෝරාගැනීම, ජීවන දීමනා සහ සංවර්ධන විකල්ප තීරණය කරනු ලබන්නේ බලපෑමට ලක්වූ පුද්ගලයින්ගෙන් සම්පූර්ණ තොරතුරු විමසීමකින් පසුව බවත්;

(iii) ආදේශක ඉඩම් සැපයීම හෝ වන්දි වශයෙන් මුදල් ගෙවීම සිදු කරනු ලබන්නේ නැතිවූ ඉඩම්, ඉදිකිරීම් සහ ජීවිකා වෘත්තීන් සලකා බැලීමෙන් පසුව බවත්;

(iv) මුළු ඉඩම සඳහා කඩිනමින් ප්‍රතිසම්පාදන අගයන් වශයෙන් වන්දි පිරිනැමෙන බවත්;

(v) ඉඩම් සඳහා ලේඛනගත හිමිකමක් නැති පුද්ගලයින්ටද සාධාරණ සැලකිල්ලක් දැක්වෙන බවත්; සහ

(vi) බලපෑමට ලක්වූ පුද්ගලයින් ප්‍රතිස්ථාපනය කිරීමට උදව් දෙන බව සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට පහසුකම් සැපයෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010 ජනවාරි සිට කොළඹ නගර සභාව තුළ ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීමේ ජාතික ප්‍රතිපත්තිය පිළිපදින ලද අවස්ථා සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන කවරේද; සහ

(ii) සියලුම මහ නගර සභා, නාගරික මධ්‍යස්ථාන සහ අගනගරවල ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීමේ ජාතික ප්‍රතිපත්තිය තදින්ම ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2304/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ දහයක කාලය තුළ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිවාඩු ලබාගෙන සහ ස්ථිර වශයෙන් වෘත්තියෙන් ඉවත් වී ගුරුවරුන් ලෙස සේවය කිරීම සඳහා විදේශගත වූ ගුරුවරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පසුගිය වර්ෂ දහය තුළ මෙරට අධ්‍යාපන අමාත්‍යාංශයේ පත්වීම් ලබා ගුරු වෘත්තියේ යෙදී සිටින විදේශිකයන් සංඛ්‍යාව ඔවුන්ගේ රට අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2631/'12

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තවත් ශක්තිමත් කිරීමට හා එම සංශෝධනය ක්‍රියාත්මක කිරීමට ඇති බාධක ඉවත් කරන බවට රජය විසින් පොරොන්දුවක් ලබාදුන් බවත්;

(ii) නැවත 2007 විශ්ව වාරික විමසුම (UPR) රැස්වීම අවස්ථාවේදී ද දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කිරීමට රජය පොරොන්දු වූ බවත්;

(iii) දහඅටවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීමෙන් එම පොරොන්දු කඩකර ඇති බවත්;

(iv) මෙම පොරොන්දු කඩකිරීම නිසා රජයේ විශ්වාසනීයභාවය ජාත්‍යන්තර වශයෙන් බිඳවැටී ඇති බවත්;

(v) එමගින් අප රට අපකීර්තියට ලක්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) උගත් පාඩම් හා ප්‍රතිසංධානය පිළිබඳ ජනාධිපති කොමිසමේ නිර්දේශයන් හා ශ්‍රී ලංකාව සම්බන්ධව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව තුළින් ස්වාධීන කොමිසන්වල අවශ්‍යතාවය නිර්දේශකර ඇති හෙයින් දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කර ස්වාධීන කොමිසන් ස්ථාපිත කිරීමට රජය වහාම පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2632/'12

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වර්ෂයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පවුල් සෞඛ්‍ය සේවිකාවන් බඳවා ගෙන තිබේද;

(ii) එම වර්ෂය තුළ බඳවාගනු ලැබූ පවුල් සෞඛ්‍ය සේවිකාවන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2012 මැයි මාසය වන විට රට තුළ සේවයේ යෙදී සිටි පවුල් සෞඛ්‍ය සේවිකාවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පවුල් සෞඛ්‍ය සේවිකාවන් සඳහා තවදුරටත් පුරප්පාඩු පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1199/'11

ගරු රවී කරුණානායක මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂ පහ තුළ, එක් එක් වර්ෂයේ දී,

(i) සමස්ත පොල් පරිභෝජනය සහ ඒක පුද්ගල පොල් පරිභෝජනය කොපමණද;

(ii) ආනයනය කරන ලද පොල් ප්‍රමාණය කොපමණද;

(iii) ආනයනය කරන ලද පොල්වල වටිනාකම කොපමණද;

(iv) පොල් ආනයනකරුවන්ට රජය විසින් සත්‍ය වශයෙන්ම ලබා දෙන සහනාධාරය, එය සනාථ කිරීමට අවශ්‍ය කරුණු ද සමග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) දේශීයව නිෂ්පාදනය කරන සහ ආනයනය කරන ලද පොල් මත පනවා ඇති සෘජු සහ වක්‍ර බදු වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1571/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, ඇත්කඳුර ගා/සීවලී මහා විද්‍යාලයේ පන්ති කාමර හතරක් සහිත ගොඩනැගිල්ලේ වහලය සහ බිත්ති දිරාපත්වී අබලන් තත්වයට පත්ව ඇති බැවින් එම විදුහලේ සිසු දරුදැරියන්හට දැඩි අනාරක්ෂිත තත්ත්වයක් යටතේ අධ්‍යාපන කටයුතු කරගෙන යෑමට සිදුව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල කඩිනමින් අලුත්වැඩියා කිරීමට සැලසුම්කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන මුදල කොපමණද;

(iii) අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2115/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග නිර්මාණ සහ සංවර්ධන සමාගම සතුව තිබී සීමාසහිත මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගමට ලබාදුන් උපකරණ, ඉඩම්, ගොඩනැගිලි හෝ වෙනත් සම්පත් කවරේද;

(ii) ඒවා පිහිටි ස්ථාන කවරේද;

(iii) ලබා දී ඇති ගොඩනැගිලිවල වර්ග ප්‍රමාණය කොපමණද;

(iv) උපකරණ සහ යන්ත්‍ර ලබාදීමේ දී එදිනට තක්සේරු කරන ලද මිල ගණන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මගනැගුම සමාගමට ලබා දුන් යන්ත්‍ර සහ උපකරණවල සමස්ත වටිනාකම කොපමණද;

(ii) එම වටිනාකම් සඳහා ගිවිසුමකට එළැඹී තිබේද;

(iii) එසේ නම්, එම ගිවිසුම සභාගත කරන්නේද;

(iv) එම ගිවිසුම අනුව ලබාගත් වටිනාකම් වෙනුවෙන් රජයට කළ යුතු ගෙවීම් අවසන් කිරීමට නියමිත කාල සීමාව කවරේද;

(v) එම ගෙවීම්වලින් දැනට ගෙවා ඇති මුදල සහ ගෙවිය යුතු මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2310/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2000 සිට 2011 දක්වා එක් එක් වර්ෂය තුළ පස්වන ශ්‍රේණියේ දී සහ අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයේදී පාසල් හැර ගිය සිසුන් සංඛ්‍යාව,

(i) ස්ත්‍රී පුරුෂභාවය අනුව;

(ii) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍ය අනුව;

(iii) ග්‍රාමීය, නාගරික සහ වතු අංශ අනුව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වර්ෂ 2000 සිට 2011 දක්වා එක් එක් වර්ෂය තුළදී පාසලකට ඇතුළත් නොකළ වයස අවුරුදු පහ සහ දහහතර අතර ළමුන්ගේ ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2000, 2005, 2010 යන වර්ෂයන්හිදී දරුවන්,

(i) ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළත්වීමේ;

(ii) පස්වැනි ශ්‍රේණිය දක්වා රැඳී සිටීමේ;

(iii) සාමාන්‍ය පෙළ දක්වා රැඳී සිටීමේ;

අනුපාතයන් ස්ත්‍රී පුරුෂ භාවය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) 2010 වර්ෂයේදී පාසල් සිසුන්ගේ පරිගණක සාක්ෂරතාව ග්‍රාමීය, නාගරික සහ වතු අංශයන් යටතේ වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1307/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මගින්, එම අමාත්‍යාංශයට අයත් නොවන ගොඩනැගිලි කුලියට හෝ බද්දට ලබාගැනීම සඳහා දරන මුළු පිරිවැය කොපමණද;

(ii) කුලියට හෝ බද්දට ගත් ගොඩනැගිලිවල වර්ග අඩියක් සඳහා මිල කොපමණද;

(iii) ගොඩනැගිලිවල බදු කාලය කොපමණද;

යන්න 2010 සහ 2011 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ කිසිදු ආයතනයකට අයත් නොවන වාහන කුලියට හෝ බද්දට ලබාගැනීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) අයත් මුළු වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) බාහිරින් ලබාගන්නා අනෙකුත් සේවා කවරේද;

(iv) ඉහත සඳහන් බාහිරින් ලබාගත් සේවා සඳහා පිරිවැය කොපමණද;

(v) බාහිරින් සේවා ලබාගැනීමේ පදනමින් ගිවිසුම්වලට එළැඹී පුද්ගල සංඛ්‍යාව කොපමණද;

(vi) සමස්ත කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව කොපමණද;

යන්න මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයට අදාළව ඉහත කී වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1576/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රදේශයේ පිහිටි, ඉහළ බෙලිගල්ල ග්‍රාමීය රෝහලේ බාහිර රෝගී අංශය පවත්වාගෙන යන ගොඩනැගිල්ල දැඩි සේ අබලන් වී ඇති බවත්;

(ii) මෙම තත්ත්වය ප්‍රතිකාර ගැනීමට පැමිණෙන රෝගීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ජීවිතවලට ද තර්ජනයක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2116/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2011 දක්වා කාල සීමාව තුළ සීමාසහිත මගනැගුම මාර්ග ඉදි කිරීම් උපකරණ සමාගමේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් පිරියත හා උපකරණ සඳහා ලැබිය යුතු කුලී ගාස්තු වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කුලී ගාස්තුවලින් එක් එක් වර්ෂයේදී අය කරගෙන ඇති ප්‍රමාණය සහ අයකර නොගත් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගාස්තු අය කර නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2311/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අදාළවන අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාග ප්‍රතිඵල ඇගයීම සඳහා "ඉසෙඩ් අගය" භාවිතා කිරීම ආරම්භ කළ වර්ෂය කුමක්ද;

(ii) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සැලකිල්ලට ගත් දිස්ත්‍රික් ලකුණු මට්ටම වෙනස් කොට ඉසෙඩ් අගය සැලකිල්ලට ගැනීමට තීරණය කිරීමට ප්‍රධාන හේතුව කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ භාවිතවන පරිදි විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයන්හි ප්‍රතිඵල ඇගයීම සඳහා ඉසෙඩ් අගය ක්‍රමවේදය යොදාගත් ලෝකයේ අනෙකුත් රටවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අ.පො.ස. උසස් පෙළ විභාගයේදී එක් විෂයයකට හෝ පෙනී නොසිටි සිසුවෙක් සඳහා වුවද විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී සැලකිල්ලට ගන්නා අවසන් ඉසෙඩ් අගය ලබා දෙන්නේද;

(ii) ඉහත විභාගයේදී සියලු විෂයයන්ට පෙනී සිට, එක් විෂයයක් හෝ අසමත් සිසුවකු සඳහා ද විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී සැලකිල්ලට ගන්නා අවසන් ඉසෙඩ් අගය ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?